# 12 දිවි මඟට ඔවදන් මිණි

ඊ. ඩබ්ලිව්. අදිකාරම්තුමා සිය ළමා වියේ දී අධ්‍යාපනය ලැබුවේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ ය. එතුමා අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ ආකාරය අපේ දූ දරුවන්ට මහඟු ආදර්ශයකි. පරිසරයට ආදරය කරමින් නිර්මාංස ආහාරයෙන් ම ජීවත් වූ එතුමාගේ ජීවිතයෙන් අප සැමට ගත හැකි ආදර්ශ බොහෝ ය.

ඇතැම් දිනක උදෑසන, අම්මා හිස් හැඳිලිය අතගා සුසුම් හෙළනු අදිකාරම්ට ඇසෙයි. ඔහු මවගේ දෙපා මුල වැඳ වැටී,

"අම්මේ මං යනවා" කියයි.

ඈ ඔහුගේ හිස සිඹ "අනේ පුතේ, අද ශතපහක් නැහැ" යි කියයි.

"ඉතින් මොකද අම්මේ..." අදිකාරම්ට පාසලට යන අතර, අම්මාගේ දුක්මුසු මුහුණ අමතක වේ. අවට පරිසරය ඔහුට කුතුහලය පිරුණු ආස්වාදයක් ඇති කරවන හෙයිනි.

"අද විවේකයෙන් පසු ළමයින්ට නිවාඩු දෙනවා," පන්තියේ ආචාර්ය අබේගුණවර්ධන මහතා කී ය.

"ඇයි ?" අදිකාරම් ඇසී ය.

"ඇයි, මේ විදුහලේ ශිෂ්‍යයකු වන ඔලිවර් ගුණතිලක බී. ඒ. විභාගයෙන් සමත් වෙලා අද ප්‍රතිඵල ආවා. මේක අපේ විදුහලට ලොකු ගෞරවයක්. මේ ළමයිනුත් දිගට ම ඉගෙනගන්න ඕනෑ. බී. ඒ. කාරයෙක් වීම ඉතා උතුම් දෙයක් ..."

ගුරුතුමාගේ පිළිතුර අදිකාරම් තුළ අලුත් ධෛර්යයක් ඇති කළේ ය.

පාසලේ දක්ෂතම ශිෂ්‍යයාට හිමි ත්‍යාග ද ලබාගෙන, ගුරු සිසු දෙපක්ෂයේ ම සිත් දිනාගනිමින්, කේම්බ්‍රිජ් කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට ඉදිරිපත් වන අවස්ථාව තෙක්, කුඩා අදිකාරම් පැමිණියේ ය. ඔහු එය ඉතා පහසුවෙන් උසස් ලෙස දිනාගනු ඇතැයි ඔහුගේ ගුරුවරු කීහ. සත් වන පන්තියේ දී ඔහුට ඉගැන්වූ එරික් ගුණසේකර මහතා සිය ශිෂ්‍යයා කේම්බ්‍රිජ් කනිෂ්ඨයට ගිය විට මුහුණ දෙන ඒ පරීක්ෂණයෙන් ලබන විශිෂ්ට සාමර්ථ්‍යය ගැන දැඩි විශ්වාසය පළ කළේ ය.

ඔහු එයින් ඉතා උසස් ලෙස සමත් විය.

ඔහු සමඟ එකට ඉගෙනගත්, අශ්වකරත්තවලින් හා මෝටර් රථවලින් ආ ඇතැම් ශිෂ්‍යයන්ට එය සමත් වීම අපහසු විය.

වර්ෂ 1905 මාර්තු මස 29 වන දින උපත ලද ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්තුමා කුඩා අවධියේ දී ම, එතුමාගේ පියා මිය ගියේ ය. එම නිසා ඉතා දුෂ්කරතා මැද ජීවන ගමන

ඇරඹීමට එතුමාට සිදු විය. අදිකාරම් 1915 දී කොළඹ වෙස්ලි විද්‍යාලයට ඇතුළු වී, මූලික අධ්‍යාපනය ලැබුවේ ය. ඉන් පසු 1922 දී උසස් අධ්‍යාපනය සඳහා යුනිවර්සිටි කොලීජියට බැඳුණේ ය. එහි දී විද්‍යා විෂයයන් හදාරමින් සිටි නමුත්, ආර්ථික අපහසුතා මැද එය නතර විය. එහෙත් පසුව මානව ශාස්ත්‍රීය විෂයයන් හදාරා, 1926 දී බී. ඒ. උපාධියෙන් ප්‍රථම පන්ති සාමර්ථ්‍යයක් දිනාගත්තේ ය. ඉන් පසු 1931 දී එම්. ඒ. උපාධිය ද , 1933 දී ආචාර්ය (පී. එච්. ඩී) උපාධිය ද, ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ලබාගත්තේ ය. එතුමා ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කළ ''ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය'' නමැති පර්යේෂණාත්මක නිබන්ධය, විද්වතුන්ගේ ගෞරවයට පාත්‍ර වූ වැදගත් ශාස්ත්‍රීය ග්‍රන්ථයකි.

මේ ග්‍රන්ථයේ පිටපතක් ද ඔහු අම්මාට පෙන්නුවේ ය.

ඇගේ මුහුණින් පිළිබිඹු වූ සතුට ඔහුට පෙනිණ.

ඇත්තට ම අම්මා කෙනකු සතුටු කිරීම තරම් සතුටක් දරුවකුට ඇද්දැයි අදිකාරම් ඔහුගෙන් ම ප්‍රශ්න කළේ ය.

අදිකාරම් ප්‍රිය කළේ ගුරුවෘත්තිය ය. ඔහු ඒ ගැන මෙසේ කී ය. "මනුෂ්‍යයාට තිබෙන ඉතා ම උසස් වෘත්තිය ගුරුකම බැව් මම තරයේ ම විශ්වාස කරමි. අද ජීවත් වීම සඳහා මුදලක් අවශ්‍ය හෙයින්, පඩියක් ලබා නො ගෙන වැඩ කිරීමට පුළුවන්කමක් නැත. එහෙත් ගුරුවෘත්තිය පඩියට යටකර තැබිය යුත්තක් නො වේ...."

දිනක්, ඔහු, ආනන්ද ශාස්ත්‍රාලයේ නේවාසිකාගාරයේ භෝජන ශාලාවට ගියේ දිවා භෝජනය සඳහා ය. අමරසේකර නමැති ශිෂ්‍යයෙක් ඔහු අසලට පැමිණ හිඳගෙන බත් කෑවේ ය.

"කොහොම ද? දුර ඉඳල ද එන්නේ?" ඔහු අදිකාරම්ගෙන් ඇසුවේ ය.

"ඒ තරම් දුරක් නැහැ."

"මෙහේ කෑම තරමක් හොඳයි නේ ද?"

"ඔව් ...හොඳයි."

ශිෂ්‍යයා බොහෝ දේ කීවේ ය. ඔහු අදිකාරම් හොඳ මිතුරකු සේ සලකා ඔහු සමග කුලුපග විය. කෑම අවසන් කොට ඔහු පිටතට ගියේ, අදිකාරම්ගේ පිටට ද තට්ටු කරමිනි.

කෑම වෙලාවෙන් පසු පන්ති පටන් ගැනිණි.

අර ශිෂ්‍යයා පන්තියේ ඉදිරි පෙළ අසුනක හිඳ සිටියේ ය. ගුරුවරයා එන විට ළමයි නැඟී සිටියහ.

අර ශිෂ්‍යයා තැති ගත්තේ ය. "මේ ගුරුවරයා සමගයි මා දවල්ට කෑවේ. මම ඔහුගේ පිටට ද තට්ටු කළා."

ගුරුවරයා අදිකාරම් ය. ඔහු ශිෂ්‍යයා දෙස නො බලා, ඉගැන්වීමේ යෙදුණි. පාඩම අවසානයේ දී ශිෂ්‍යයා අදිකාරම් ගුරුතුමා හමු වීය. සමාව ඉල්ලුවේ ය.

"අමරසේකර, ඔබ වරදක් කළේ නැහැ සමාව ඉල්ලන්න තරම්. අපි යාළුවන් වගේ ඉඳිමු," අදිකාරම් කී ය.

"අම්මේ, මම මගේ නම වෙනස් කරනවා. සිංහල නමක් ගන්නවා."

ඈ විස්මයෙන් ඔහු දෙස බැලුවා ය.

"තාත්තා තියපු නම වෙනස් කරන්න ? "

"ඔව්, අම්මේ පිටරටවලට ගිහින් අපේ නම කිව්වම ඒ මිනිස්සු පුදුම වෙනවා, කළුහම වුණාට තියෙන්නේ සුද්දන්ගේ නම් නේ ද කියලා. එඩ්වඩ් විනිෆ්‍රඩ් මගේ නම. මම ඒ වෙනුවට වෙනත් නමක් ගන්නවා"

"මොකක් ද නම ?"

"වීරසේකර..."

"ඒක හොඳයි, කියන්නත් පහසුයි."

අවවාදයට වඩා ආදර්ශය උතුම් ය යන්න ඔහු සිය ජීවිතයෙන් පෙන්වූයේ ය.

සත්ත්ව කරුණාව පිළිබඳ ව ශිෂ්‍යයන්ට කියා දුන් ඔහු, ක්‍රියාවෙන් ද එය පෙන්වූයේ ය. "සැබෑ සත්ත්ව කරුණාවක් ඇති අයකුට සතකුගේ මස් කෑ හැකි ද?" ඔහු ඇසුවේ ය. ඔහු නිසා බොහෝ ශිෂ්‍යයෝ නිර්මාංස ආහාරවලට හුරු වූහ.

දිනක් අදිකාරම් සිය මෝටර් රියෙන් පාගොඩ සිට ආනන්ද ශාස්ත්‍රාලයට එමින් සිටියේ ය. අඩි කීපයක් ඉදිරියෙන් මහපාර හරහා කළු ඉරක් ඔහුට පෙනිණ. රිය නවතා ඒ කුමක් දැයි බැලූ ඔහුට කුඹි වැළක් පෙනිණ. රිය පැදවුව හොත් කුඹි සිය ගණනක් මිය යනු ඇත. ඔහු පාර අද්දර නිවසක සිටි අයකුට රිය බලාගන්න යැයි කියා, පාසලට පයින් ම ගියේ ය.

පාසලට පමා වී එන ශිෂ්‍යයන්ට දෙන දඬුවම වූයේ එක් ගසක් යට මිනිත්තු කීපයක් සිටුවා තැබීම ය. එදා අදිකාරම් රිය මඟ තබා පයින් පැමිණි හෙයින් පාසල ඇරඹෙන වේලාව පසු වී තිබිණ.

ඔහු සිය කාර්යාලයට පිවිසෙනු වෙනුවට, අර ගස යටට ගියේ ය.

පමා වී පැමිණි තවත් ළමයි කීප දෙනෙක් ද එහි වූහ.

දිනක් එක් පියෙක් දරුවකු සමඟ ආනන්ද ශාස්ත්‍රාලයේ විදුහල්පතිගේ කාර්යාලයට ඇතුළු විය. අදිකාරම් ඉදිරියට ගිය ඔහු, රුපියල් පහේ නෝට්ටුවක් මේසය මත තැබුවේ ය.

"ඇයි?"

"ගාස්තු නො ගෙව්වා කියා මේ ළමයා උදේ ඉස්කෝලෙන් පිට කරලා තිබුණා."

"ඉතිං කොහොම ද පැය දෙකක් ඇතුළත ගාස්තුව හොයාගත්තේ ?"

පියා සාක්කුවෙන් ගත් කඩදාසි කැබැල්ලක් අදිකාරම්ට පෙන්වූයේ ය. එය කරාබු කුට්ටමක් උකස් තබා රුපියල් පහක් ලබාගත් බව කියැවෙන රිසිට් පතකි. "කාගෙද කරාබු කුට්ටම...?"

"මේ ළමයින්ගේ අම්මගෙ..."

"මට මේ රුපියල් පහ බාරගන්න බැහැ..." අදිකාරම් අසුනෙන් නැඟිටිමින් කී ය.

එහෙත් පියා එය ආපසු නො ගත්තේ ය. ඔහුගේ දෑස කඳුළෙන් පිරී තිබිණි.

"මිනිසාට වාතය නොමිලේ ලැබෙන්නාක් මෙන් ම අධ්‍යාපනයත් නොමිලේ ලැබිය යුතු ය. මේ පවතින ක්‍රමය නිසා දිළිඳු ශිෂ්‍යයන්ට අධ්‍යාපනය තහනම් වෙනවා. මුදල් ඇති එක පන්තියකට පමණක් අධ්‍යාපනය සීමා වෙනවා." නිදහස් අධ්‍යාපනය ඇති කිරීමේ අදිටන එතුමා සිතට ගත්තේ එදින ය.

දහම් පාසලේ එක් ගුරුවරයෙක් දිනක් "සත්ත්ව කරුණාව" පිළිබඳ ළමයින් සමඟ සාකච්ඡා කළේ ය.

"සතුන්ට ආදරේ ඇති කෙනකුට සතුන්ගේ මස් කන්නට පුළුවන් ද" යි ඔහු ප්‍රශ්න

කළේ ය.

මේ ප්‍රශ්නය අදිකාරම්ගේ සිත කැලඹීමකට පත් කළේ ය.

"සතුන් දැකීමෙන්, උන්ට ළං වීමෙන් මා ආස්වාදයක් දැනුමක් ලැබුවා ඇත්ත යි. උන් කෙරේ ආදරයක් තිබුණු බවත් ඇත්ත යි. ඇත්තට ම ඒ ඇත්ත ආදරයක් ද? මස් මාළු ආහාරයට ගන්නා කෙනෙක් සතුන්ට ආදරේ ද? ගුරුතුමාගේ ප්‍රශ්නය මා කැලඹුවා"

" අද සිට මස් මාළු කෑමෙන් වැළකෙමි"

මවිසින් මස් මාළු කෑම අත් හරින ලද්දේ මගේ වයස අවුරුදු දහහතරේ දී ය. එසේ කරන ලද්දේ, ඒ කාලයේ දී ඇසූ දේශනයක් අනුව මස් මාළු කෑම පව් සිදු වන ක්‍රියාවක් යැයි සිතුණු බැවිනි. එදා සිට අද වන තුරු එම ආහාරයෙන් සම්පූර්ණයෙන් මම වැළකී සිටිමි. එහෙත් අද මා මස් මාළු නොකන්නේ පව් සිදු වෙයි යන බිය නිසා වත්, මාංසාහාරය පෝෂ්‍යදායි නො වේ ය යන හැඟීම නිසා වත්, මිනිස් සිරුර පරිණාමයෙන් සැදී තිබෙන්නේ නිර්මාංසාහාරයට ගැළපෙන අයුරින් ය යන විශ්වාසයක් නිසා වත් නො වේ. සතුන් නොමරා මස් කෑමට නොහැකි බැවිනි.

දිනපතා හැම වේලකට ම ඔහු සතුන් සඳහා ආහාර සැපයුවේ ය. ඔහුගේ ගෙවත්තේ සතුන්ට කෑම තබන තැන් කීපයක් තිබිණි.

එතුමා සතුන්ට කොතරම් ආදරයක්, කරුණාවක් දැක්වූයේ ද යනු හොඳින් ම පැහැදිලි වන සුන්දර අවස්ථාවක් තිබුණි. එනම් වෙනත් අය නොමැති වේලාවන්ට ගෙවත්තේ සැරිසරන කුරුල්ලන්, එතුමාගේ උරහිසේ වසන්නේ නිර්භය ව ය.

යම් මිනිසකු තුළ ශ්‍රේෂ්ඨත්වයේ ලක්ෂණ සියල්ල එක්වර දක්නට හැකි නම් ආශ්චර්යයකි. එහෙත් මිනිස් ලොව භාග්‍යයකට මෙන් එවන් පුද්ගලයෝ කලාතුරකින් දක්නට ලැබෙති. ශ්‍රී ලංකාවේ භාග්‍යයක් නිසා පහළ වූ, පූජනීය බවට සර්වප්‍රකාරයෙන් සුදුසු වූ, මානව රත්නයක් වී ය. ඒ ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා ය.



ආචාර්ය උපාධියෙන් පසු පෙරළා ලක්දිවට පැමිණි අදිකාරම් මහතාගේ අධ්‍යාපන සේවාව ඇරඹුණේ කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ විදුහල්පති තනතුර භාර ගැනීමෙනි. 1934 සිට 1946 දක්වා වූ එම සේවා කාලය තුළ, ඔහු ආනන්ද ශාස්ත්‍රාලය දහස් ගණන් ශිෂ්‍යයන්ගෙන් හා ස්ථාවර ගොඩනැගිලිවලින් යුත්, දිවයිනේ පළමු පෙළේ උසස් විදුහලක් බවට පත් කළේ ය, ඒ අවධියේ දී ම, ලක්දිව වෙනත් ප්‍රදේශවල ද විදුහල් පිහිටුවීමෙහි ලා පුරෝගාමී ව ක්‍රියා කළේ ය. එය මෙරට බෞද්ධ දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ගත් එක් පියවරකි. 1937 දී මහරගම විද්‍යාකර විද්‍යාලයය ඇරඹීමෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක විණි. ඉන් පසු 1940 වර්ෂය තුළ ඔහු නුගේගොඩ අනුලා විද්‍යාලය, මතුගම ආනන්ද ශාස්ත්‍රාලය, බත්තරමුල්ල මහා විද්‍යාලය, උඩහමුල්ල මහා විද්‍යාලය, කරවනැල්ල මහා විද්‍යාලය යන විදුහල් ආරම්භ කළේ ය.

1941 දී ආරම්භ කළ නුගේගොඩ නිග්‍රෝධ ( අද මහාමායා ) විද්‍යාලය ද තවත් එබඳු විදුහලකි. තව ද මෙතුමා නිදහස් අධ්‍යාපන සටනේ උද්‍යෝගයෙන් කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නඟා සිටුවීමට මහත් සේවාවක් ඉටු කළේ ය. 1954 සිට 1957 දක්වා පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ පාඨශාලා සාමාන්‍යාධිකාරී ධුරය දරමින්, ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපනය දියුණු කිරීමට ද මෙතුමා දැඩි ප්‍රයත්නයක් දැරී ය.

එතුමා, පසු ව වැඩි උනන්දුවක් දැක්වූයේ නවීන විද්‍යා ඥානය සිංහල මාධ්‍යයෙන් ලබා දීම සඳහා ය. එහි දී ඔහු පුවත්පත්වලට විද්‍යා ලිපි සපයමින්, ගුවන්විදුලියෙන් විද්‍යා කතා පවත්වමින්, විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමට පුරෝගාමී වූවා පමණක් නො ව, විද්‍යාවේ ඉංග්‍රීසි පාරිභාෂික වචනවලට සිංහල පාරිභාෂික වචන මාලාවක් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සකසා දීමෙන් කළ සේවය ශ්‍රී ලාංකික ජනතාවට අමතක කළ නො හැකි ය. 1966 සිට 1970 දක්වා උසස් අධ්‍යාපන සභාවේ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කරමින්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි ප්‍රතිසංවිධානයක් ඇති කිරීමට අදිකාරම්තුමා කළ සේවය ද සුළුපටු නො වේ.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම, අනුන්ට හෝ සමාජයට හෝ බරක් හෝ හිංසාවක් හෝ නො වන පරිදි, සැහැල්ලු ආදර්ශ සම්පන්න අල්පේච්ඡ දිවිපෙවෙතක් ගෙන ගිය, නො බිය ව සිත ඇති දැ පැවසූ නිදහස් චින්තකයකු වූ අදිකාරම් මහතාගෙන් ඉටු වූ වැදගත් ම

සේවාව සේ සැලකිය හැක්කේ, අපේ තරුණ පරපුර දුසිරිතින් මුදා සුමඟට ගෙන සුඛිත මුදිත සමාජයක් ගොඩනැගීමේ අරමුණින් ගෙනගිය වැඩ පිළිවෙළ යි. මේ නිසා පසු කාලයේ දී අදිකාරම්තුමා ප්‍රසිද්ධියට පත් වූයේ අධ්‍යාපනඥයකුට වඩා සමාජ සේවකයකු හා දාර්ශනිකයකු හැටියට ය.

අදිකාරම්තුමා, සිංහල කවියට, චාරිත්‍රවල මෙන් ම සදාචාරයට මහත් ඇල්මක් දැක්වී ය; ඒ ඔස්සේ ම මෙරට තරුණයන් නිසි මඟට යොමු කරවාගැනීමට උත්සාහ දැරී ය. රටේ අනාගතය වෙනුවෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමය සාර්ථක කරගැනීමට උර දුන්නේ ද යම් අධ්‍යාපන මට්ටමක් ඇති ව යොවුන් වියට එළඹීම තනි පුද්ගලයකු වශයෙන් නො ව පොදුවේ රටක් වශයෙන් ඉදිරියට යෑමට යෝග්‍ය අත්වැලක් වන බව එතුමා හොඳින් දැන සිටි නිසා ය. "වැඩිහිටියන් තැනීම අපහසු ය. එහෙත් අපට දරුවන් තැනිය හැකි ය. පිරිසිදු සිත් ඇති ව උපදින දරුවන් කිලිටි වන්නට නො දී රැකගනිමින්, ඔවුන් හදාවඩා ගැනීමට අපි උනන්දු වෙමු." මෙබඳු ප්‍රකාශ කළ එතුමා සිතුවේ අනාගත දරු පරපුර ගැන ය.

එතුමා බොළඳ අදහස් පසුපස හඹා නො ගොස්, සදාචාර සම්පන්න මිනිස් පරපුරක් බිහි කිරීමට තම ජීවිතයේ වැඩි කොටසක් කැප කළේ ය. පුවත්පත්, රූපවාහිනිය, ගුවන් විදුලිය ආදි ජනසන්නිවේදන මාධ්‍ය තරුණ පරපුර යහපතට නො ව අයහපතට යෙදෙන බැව් දුටු අදිකාරම්තුමා, බොහෝ කම්පාවට පත් විය. ජනසන්නිවේදන මාධ්‍ය තරුණ විනාශය සඳහා යෙදවීම ගැන, එතුමා ඉඩ ලද හැම විටෙක ම නිර්භීත ව, සිය ස්වාධීන අදහස් ප්‍රකාශ කර සිටියේ ය. රූපවාහිනිය මිනිස් මොළයෙන් නිපදවන ලද ඉතා ආශ්චර්යවත් උපකරණයකි. පොදුවේ ගත්විට එය හොඳ හෝ නරක හෝ වශයෙන් වෙන් කළ නො හැකි ය. වෙළෙඳ දැන්වීම්, ටෙලිනාට්‍ය, චිත්‍රපටි ආදියෙන් මුදල් උපයාගැනීම සඳහා පෙන්වන දර්ශන ඉතා වැඩි වශයෙන් නරක ඒවා ය; විශේෂයෙන් හැදෙන තරුණයන් නොමඟ යවනසුලු ඒවා ය. පිපීගෙන එන මලක් විකසිත වන්නට පෙර විකසිත කරන්නට ගිය හොත් වන්නේ එය පිපෙන්නට පෙර විනාශ වීම යි. මේ තත්ත්වයෙන් සමාජය මුදවාගෙන සදාචාර සම්පන්න පරම්පරාවක් ඇති කිරීම එතුමාගේ එක ම අභිප්‍රාය විය.

## 12.1. ක්‍රියාකාරකම 1

1. ආචාර්ය ඊ ඩබ්ලිව්. අදිකාරම් මහතා ස්වකීය ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කළ නිබන්ධය කුමක් ද? එහි ඇති විශේෂත්වය කවරේ ද?
2. ඔහු ප්‍රිය කළ වෘත්තිය කුමක් ද? එයට තුඩු දුන්නේ කවර හේතුවක් ද?
3. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමට ඔහු ගත් ප්‍රයත්නය සැකෙවින් දක්වන්න.
4. අදිකාරම්තුමා නිර්මාංස ආහාරයට පෙලඹුණේ කෙසේ ද ?
5. අවවාදයට වඩා ආදර්ශය උතුම් බව කියැවෙන අවස්ථාවක් පාඩමෙන් උපුටා දක්වන්න.

## 12.2 ක්‍රියාකාරකම 2

**පහත දැක්වෙන පදවලට සමාන පද පාඩමෙන් තෝරා වාක්‍යය බැගින් ලියන්න.**

i. ඉසුඹුලන්න.
ii. ආහ්ලාදය
iii. දෛනික
iv. දරිද්‍ර
v. ප්‍රභාතය
vi. පවර
vii. අභීත
viii. පුදුමය

**පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථවත් පද පාඩමෙන් උපුටා ලියන්න.**

i. මුකුලිත
ii. උදාසීන
iii. අනවශ්‍ය
iv. පිළිතුර
v. අධෝගාමී
vi. අප්‍රසිද්ධ
vii. පරාධීන
viii. සාමාන්‍ය

## 12.3 ක්‍රියාකාරකම 3

**කර්තෘකාරක, කර්මකාරක**

කර්තෘකාරක හා කර්මකාරක යැයි, වැකි සකස් කරන ක්‍රම දෙකක් සිංහලයේ දක්නට ලැබේ. කර්තෘකාරක වාක්‍යයක් යනු, කර්තෘ උක්ත වන වාක්‍යයකි. කර්මකාරක වාක්‍යයක් යනු කර්මය, උක්ත වන වාක්‍යයකි. පුවත්පත් සිරස්තලවල කර්මකාරක වාක්‍ය රටාව බෙහෙවින් දක්නට ලැබේ.

**පහත සඳහන් වාක්‍ය දෙස බලන්න.**

"මිනිස්සු අප ඇමතුවෝ ය". මෙහි අවසාන ක්‍රියා රූපය "ඇමතුවෝ" යන්න යි. එසේ ඇමතීම සිදු කරන්නෝ මිනිස්සු ය. එබැවින් "මිනිස්සු" යන පදය කර්තෘ පදය වන අතර එය උක්ත වේ. ඒ අනුව මෙය කර්තෘකාරක වාක්‍යයකි. මේ වාක්‍යය කර්මකාරකයට හැරවීමේ දී, උක්තය අනුක්ත විය යුතු ය; කර්මය උක්ත විය යුතු ය. එවිට "මිනිස්සු" - "මිනිසුන් " ලෙසත් "අප" - "අපි" ලෙසත් යෙදීම කළ යුතු ය. එසේ කළ විට උක්ත වූ කර්මයට අනුව (අපි) අවසාන ක්‍රියාව ඉබේ සිදු වන පරිදි තැබීම කළ යුතු ය. එවිට

මිනිසුන් විසින් අපි ඇමතුණෙමු / අමතනු ලැබුවෙමු / අමතන ලද්දෙමු / අමතනු ලැබීමු යනුවෙන් විය යුතු ය.

**කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට හැරවීමේ දී**

1. කර්තෘ අනුක්ත වීම,
2. කර්මය උක්ත වීම,
3. අනුක්ත කර්තෘට පසුව 'විසින්' යන පදය යෙදීම,
4. උක්ත වූ කර්මයට අනුව ආඛ්‍යාතය තැබීම,
5. ආඛ්‍යාතයේ කාලය වෙනස් නො වීම,

අවශ්‍ය ය.

**කර්මකාරකය හඳුනාගැනීමට හා වාක්‍යවල විවිධ ස්වරූපයන් දැනගැනීමට පහත සඳහන් වැකි කියවන්න.**

පියා දරුවා රකියි.

පියා විසින් දරුවා රැකෙයි.

පියා විසින් දරුවා රකිනු ලැබේ.

පියා විසින් දරුවා රකිනු ලබයි.

දරුවා රැකෙන්නේ පියා විසිනි.

පියා අප රැකී ය.

පියා විසින් අපි රකිනු ලැබීමු.

පියා විසින් අපි රකිනු ලද්දෙමු.

**කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ඇති අයුරු බලන්න.**

1. ළමයි සතුන් ඇති කරති. / කර්තෘකාරක

   ළමයින් විසින් සත්තු ඇති කෙරෙත්. / කර්මකාරක

2. අපි නැට්ටුවන් දැක්කෙමු. / කර්තෘකාරක

   අප විසින් නැට්ටුවෝ දකිනු ලැබූහ. / කර්මකාරක

**පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.**

1. පුරාතනයේ මිනිස්සු දෙවිදේවතාවන් පිදූහ.
2. අපි ගුරුවරුන්ගේ ආශිර්වාදය ලැබුවෙමු.
3. යුද්ධ භටයෝ යුද්ධභූමියේ දී සතුරන් මරුමුවට පත් කළහ.
4. උයනෙහි නිදැල්ලේ සිටි මිතුරෝ මා එතැනට කැඳවූහ.
5. සත්පුරුෂයෝ මහජන ප්‍රසාදය ලබන්නෝ ය.

**පහත සඳහන් වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.**

1. ගෙවිලියන් විසින් කුකුළු පැටවු විකිණෙති.
2. ධර්මය විසින් ධර්මයෙහි හැසිරෙන්නෝ රැකෙති.
3. මව විසින් දරිය පෝෂණය කෙරිණි.
4. රජය විසින් රට වැසියෝ ආරක්ෂා කෙරෙති.
5. දිවියන් විසින් මුවෝ මැරෙති.

## 12.4. ක්‍රියාකාරකම 4

1. මේ පාඩම නිශ්ශබ්ද ව කියවන්න.
2. අදිකාරම්තුමා වැනි ආදර්ශවත් චරිතයක් පිළිබඳ ව පාසලේ උදෑසන රැස්වීමේ දී කථාවක් කරන්න.
3. අදිකාරම්තුමාගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ වගුගත කරන්න.

### රචනයක් ලියමු

"මා අගය කරන ආදර්ශවත් චරිතය" යන මැයින් රචනයක් ලියන්න.

## 12.5. පැවරුම

1. පන්තිය කණ්ඩායම් කීපයකට බෙදී, එක් එක් කණ්ඩායම මෙවැනි ආදර්ශවත් චරිත පිළිබඳ ව පොත්පිංච බැගින් නිර්මාණය කරන්න.

**සංකල්පනා**

පින් මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතු ම ය ඉතා ගරු
එක පුන්සඳින් දුරු වෙයි ලොව ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නො ම වේ ය දුරු

**සුභාෂිතය**